Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**සිංහල භාෂාව හා සාහිත්‍යය තරගාවලිය 2023**

**කලාප මට්ටම**

**භාෂා භාවිතය හා අවබෝධය**

**06 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

- අපේක්ෂකයාගේ නම :- ....................................................................................................
- විදුහලේ නම සහ ලිපිනය:-...........................................................................................
- කලාපය:- .........................................................................................................................
- පාසල් වර්ගය:-200 තෙක්/ 201 සිට 500/ 500 ට වැඩි.

I සහ II යන කොටස් වල ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

**I කොටස**

01. අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

I ඉහළ , ඉහල

II ජන කතා , ජන කථා

III පෝෂණය , පෝෂනය

IV ප්‍රබෝධය , ප්‍රභෝදය

V වලාකුලු , වලාකුළු

VI වාර්තාව , වාර්ථාව

VII අන්ධකාරය , අන්දකාරය

VIII වියලි , වියළි

IX සමස්ත , සමස්ථ

X නිෂ්ඵල , නිශ්ඵල

(ලකුණු 1X 10 = 10 යි)

02. පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න

I ඇවිලෙමින් තිබූ ................................... සුළඟට නිවී ගියේය . (පහණ , පහන)

II ප්‍රජාපතී ගෝතමිය සිදුහත් කුමරුගේ ....................මව වූවාය . ( සුළු , සුලු)

III තරු රටාවලින් ........................ ගැබ අලංකාර විය. ( නුබ , නුඹ )

IV බෝධිසත්වයෝ පොකුණ වට කොට හටගත් සියලු ............. දඬු ඒකච්ජිද්‍ර වේවායි කියා අධිෂ්ඨාන කළෝය. (හට , බට)

V ජයසේකර මහතා සිය ගොවිපළේ සියලු ......................වලින් එක ම ප්‍රතිඵල අපේක්ෂා නොකළේය.( පැළ , පැල)

(ලකුණු 1X 5 = 05 යි)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

03. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

මේ තුන් දෙනා ඔහොම යනකොට ඔන්න එක දෙණිපතක හිටපු නරියෙක් දුටුවා මේ ඇත්තන් යන මේ අපූරු ගමන. දැකලා කපටි නරියා හූ කියලා හිනා උණා. හිනාවෙලා උඩබලාගෙන හයියෙන් අඩ පාලා ඇහුවා " ඈ අප්පේ , කාට දැකුමක් ද ඔය තඩේ ගෙනියන්නේ ? " කියලා . මේ නරියාගේ කතාවට ඉබ්බාට හොදට ම තරහා ආවා. තරහා ඇවිත් " මේ තඩ ගෙනියන්නේ තොපේ නැන්දලෑ දිහාට " කියලා කියන් ට හිතා ගෙන කට ඇරියා විතරයි , නැට්ටෙන් ගැලවුණු තල් ගෙඩියක් වගේ ඉබ්බා ජොග් ගාලා දෙණියට වැටුණා. ඒ ගමන නරියා ඒක දැකලා "ඔන්න බොලේ අද අහසින් වැටුණා මසක් කියාගෙන ඉබ්බා ළඟට දිව්වා.

I නාම විශේෂණ පදයක් තෝරා ලියන්න.

.........................................................................................................................

II සඤ්ඤක අක්ෂරයක් සහිත වචනයක් ලියන්න.

.........................................................................

III ඡේදයේ ඇතුළත් උපමාවක් ලියන්න.

.........................................................................................................................

IV " හිනා උණා " යන පදය ලේඛන ව්‍යවහාරයට අනුව ලියන්න .

.........................................................................................................................

V ඉහත ඡේදයේ ඇති විරාම ලකුණක් උපුටා දක්වා එහි නම ලියන්න.

.........................................................................................................................

(ලකුණු 1X 5 = 05 යි)

04. පහත වචනවල තද කළු අකුරින් මුද්‍රිත අකුරේ යෙදී ඇති පිල්ලම නම් කරන්න.

I අරුත් - ........................................................................

II රුකියාව - ........................................................................

III කතුර - ........................................................................

IV පෝෂිත - ........................................................................

V මාතෘ - ........................................................................

(ලකුණු 1X 5 = 05 යි)

05. මුලින් දී ඇති පදයට සමානාර්ථවත් පදයක් හා විරුද්ධාර්ථවත් පදයක් ලියන්න.

| | | සමානාර්ථවත් පදය | විරුද්ධාර්ථවත් පදය |
|---|---|---|---|
| I | මව | .................................. | .......................................... |
| II | ආරම්භය | .................................. | .......................................... |
| III | විකසිත | .................................. | .......................................... |
| IV | අහස | .................................. | .......................................... |
| V | උදෑසන | .................................. | .......................................... |

(ලකුණු 2X 5 = 10 යි)

06. උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය නිවැරදි වන සේ හිස්තැනට සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

I තාරකා අහසේ දීප්තිමත් ව ........................................................ (බබළයි / බබළති )

II .......................................... කුඹුරේ ගොයම් කැපුවා ය. ( ගොවියා / ගෙවිලිය )

III නුඹලා හොඳින් පාඩම් ............................. ද ? (කළෙහි / කළෙහු )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

IV අම්මාත් තාත්තාත් නගරයට ................................ ( ගියා ය / ගියෝ ය )

V ................................ සතුන් දඩයම් කරති . ( වැද්දා / වැද්දෝ )

VI මිනිස්සු නිකරුණේ අපට දොස් ............................ (කියති / කියමු )

VII සුළි සුළඟින් ගස් කඩා ..................................... (වැටුනේය / වැටුනෝය )

VIII මැණියෝ තම දරුවන්ට ඔවදන් ................................ ( දෙයි / දෙති)

IX .................................. රැස්වීම ඇමතුවේ ය. ( විදුහල්පතිතුමා / විදුහල්පතිවරු )

X ..................................... ජයපැන් බොති . ( ඔච්හූ / නුඹ )

(ලකුණු 1X 10 = 10 යි)

07. පහත සඳහන් නාම පදවල අනුක්ත පදය ලියන්න.

පොලිස් නිලධාරීහු - ..............................................................

ලේඛකයෝ - ..............................................................

ළමයා - ..............................................................

කවීහු - ..............................................................

අපි - ..............................................................

(ලකුණු 1X 5 = 05 යි)

08. පහත වාක්‍යය සඳහා සුදුසු විරාම ලකුණු යොදා නැවත ලියන්න.

I. මේ රටේ ඇති තවත් ප්‍රධාන ආහාර වර්ගයක් නම් ඉංග්‍රීසියෙන් ජැක් නමින් හඳුන්වනු ලබන කොස් ය

II. බොහොම ඉක්මනට ආවා නේද යි විමලා කීවා ය

III. රුකඩ කපන්නා ගැමියන්ට වුවමනා දෙය පමණක් නොව නුවරුන්ට වුවමනා දෙයද සැපයුවෙකි

IV. හාත්පස පවතින අන්ධකාරය විදුලි එළිය අකුණු හඬ වැස්සක පෙර නිමිතිය

V. දරුවෙනි මේ වනයෙහි විෂ වෘක්ෂයොත් අමනුෂ්‍යාධිගෘහිත වු පුෂ්පකරණිහුත් වෙති

(ලකුණු 2X 5 = 10 යි)

## II කොටස

09. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

අප රට ඈත අතීතයේ සිට කෘෂිකර්මාන්තයට පුරුදු වූ රටකි. අප රටේ පිහිටීම මෙන් ම දේශගුණය අතින් කෘෂිකර්මාන්තයට යෝග්‍ය පසුබිමක් ලැබී ඇත. මෙරට ග්‍රාමීය ජනතාවගේ ප්‍රධාන රැකියාව ගොවිතැනයි.වී ගොවිතැන ප්‍රධාන තැනක් ගන්නා නමුදු ධාන්‍ය වර්ග මෙන්ම එළවලු හා පළතුරු වගාව ද මෙරට ගොවියාගේ ආර්ථිකය සරුසාර කරයි.මෙරට කෘෂිකාර්මික සංවර්ධනය ගැන විමසීමේ දි වතු ක්ෂේත්‍රයේ දියුණුව පිළිබඳ ව ද අප අනිවාර්යයෙන් ම අවධානය යොමු කළ යුතු ය. තේ, පොල් , රබර් මුල් කරගත් වතුවගාව මෙරට විදේශ විනිමය උපයා දෙන ප්‍රධාන ආර්ථික මාර්ගයක් වී ඇත. අනාගත පුරවැසියන් වශයෙන් රටට පා තබන බාල පරපුර ද රටේ සංවර්ධනයට දායක විය යුතුව ඇත.සංවර්ධනයට අවශ්‍ය කායික මානසික , සමාජීය හා චිත්තවේගීය වශයෙන් පෝෂණය වු අනාගත පුරවැසි පිරිසක් බවට බාල පරපුර පත්විය යුතු ය.

I කෘෂි කර්මාන්තය ට යෝග්‍ය පසුබිමක් ලෙස මෙහි දක්වා ඇත්තේ කුමක් ද ?

..........................................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

II මෙරට ග්‍රාමීය ජනතාවගේ ප්‍රධාන රැකියාව කුමක් ද ?

..........................................................................................................

III ගොවියාගේ ආර්ථිකය සරුසාර කරන වගාවන් ලෙස මෙහි සඳහන් වන වගාවන් මොනවා ද?

..........................................................................................................

IV මෙරටට විදේශ විනිමය ගෙන එන ප්‍රධාන වගාවන් මොනවා ද?

..........................................................................................................

V රටේ සංවර්ධන කාර්යයේ දී එයට දායක විය යුතු අය ලෙස මෙහි සඳහන් වන අය කවුරුන් ද?

..........................................................................................................

(ලකුණු 4X 5 = 20 යි)

10. පහත දැක්වෙන පද්‍ය පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

බැද්ද වටට සුදු මොර මල් පිපීලා
සද්ද කර ඔබරු ඒ වග කියාලා
ඉටිත් පැණිත් ලොව හැමට ම බෙදාලා
යන්නන් බඹරු දුක් මැසිවිලි කියාලා

බඹරු අඬන්නා , කඳු අස නෙළුම් මලේ
බඹරු පිට දෙබරු නාඩත් දමොර මලේ
මුතු කුඩ සේ රැලි අල්ලා බඳිති ගෙලේ
පැදලා කපාපන් රුසිරි ගොවිඳු හෙලේ

ඔතන ඉඳින්නා මෙතනට පෙනෙන්නා
ඔතනට එන්න මගෙ සිත කර කැවෙන්නා
කතා කරන කට හඬ කන නොවැටෙන්නා
හයියෙන් කතා නොකරන් පසුව දන්නා

I කුමන කාර්යයක් සම්බන්ධ ව මෙම කවිවලින් ප්‍රකාශ වන්නේ ද?

..........................................................................................................

II බඹරු සද්දකර පවසන්නේ කුමක් ද?

..........................................................................................................

III බමරුන්ගෙන් සිදුවන සේවයක් මින් කියවේ . එය කුමක් ද ?

..........................................................................................................

IV බමරු වද බැඳ ඇත්තේ කෙබඳු ස්ථානයක ද ?

..........................................................................................................

V මෙහි සඳහන් වන පුද්ගලයා , හයියෙන් කතා නොකරන ලෙස ප්‍රකාශ කර ඇත්තේ ඇයි ?

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

(ලකුණු 4X 5 = 20 යි)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**සිංහල භාෂාව හා සාහිත්‍යය තරගාවලිය 2023**

**කලාප මට්ටම**

**භාෂා භාවිතය හා අවබෝධය**

**07 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

- ❖ අපේක්ෂකයාගේ නම :- ..............................................................................................
- ❖ විදුහලේ නම සහ ලිපිනය:-..............................................................................................
- ❖ කලාපය:- ..............................................................................................
- ❖ පාසල් වර්ගයː-200 තෙක්/ 201 සිට 500/ 500 ට වැඩි.

**I සහ II යන කොටස්වල ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

## I කොටස

01. අක්ෂර වින්‍යාසය වැරදි ලෙස යෙදී ඇති පදය තෝරා , නිවැරදි කර තිත් ඉර මත ලියන්න.

I සම්ප්‍රදායානුකූල ව පොල් තෙල් පහණ දල්වා උත්සවය ආරම්භ කෙරිණි.

..............................................................................................

II අව්‍යාජත්වය , සරළත්වය සහ සංක්ෂිප්තභාවය ජන කවිවල සුවිශේෂී ගුණයකි.

..............................................................................................

III පුරාණ ගැමියෝ දෙවියන් කෙරෙහි විස්වාශය තබා කටයුතු කළහ.

..............................................................................................

IV පුස්ථකාලයේ පොත් එක් එක් විෂය අනුව වර්ග කර තිබේ.

..............................................................................................

V කුමාරතුංග මුණිදාස මහතා කියවන නුවන නමින් පොත් පෙළක් රචනා කළේය.

..............................................................................................

(ලකුණු 1X 5 = 05 යි)

02. පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය තිත් ඉර මත ලියන්න.

I ලක්දිව බුදු සසුන හා අධ්‍යාපනය නගා සිටුවීමට කටයුතු කළ අය අතර වැලිවිට සරණංකර හිමියෝ **පුමුඛ** වෙති.

..............................................................................................

II පණ්ඩිත් අමරදේවයන් **අනුස්මරණය** කිරීමේ උත්සවයක් බණ්ඩාරනායක සම්මන්ත්‍රණශාලාවේ පැවැත්විණි.

..............................................................................................

III ගුණදාස අමරසේකර මහතා **ප්‍රකට** ලේඛකයෙකි.

..............................................................................................

IV මහනායක මහනාහිමිපාණන්ගේ සුරතින් **අභිනව** විහාර මන්දිරය විවෘත කෙරිණි.

..............................................................................................

V වගා ළිඳට වැටුණු අලි පැටවා ගොඩට ගැනීමට මහත් **පරිශ්‍රමයක්** දැරීමට සිදු විය.

..............................................................................................

(ලකුණු 1X 5 = 05 යි)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

03. වරහන් තුළින් සුදුසු පද තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.

I නිසි කලට පොහොර නොයෙදීම නිසා ගොයම් ....................( පැල , පැළ) කහ ගැන්වී තිබුණි.

II දඩයක්කරුවා ............................ යෙහි සැරිසරද්දී පොළිසියට හසු විය . ( වන , වණ)

III ඩෙංගු ................ රෝගය යළි හිස ඔසවමින් ඇති බව වෛද්‍ය නිලධාරීහු පවසති. ( උන ,උණ)

IV අපි මිණිරන් ...............නැරඹීමට ගියෙමු . (පතල ,පතළ)

V කිරි ........................ වසු පැටියා දෙස අම්මා විමසිල්ලෙන් බලා සිටියි. (උරන ,උරණ)

(ලකුණු 1X 5 = 05 යි)

04. පහත සඳහන් වාක්‍යවල යෙදී ඇති සමානාර්ථවත් පද යුගලය තෝරා තිත් ඉර මත ලියන්න.

I රූපවාහිනී ප්‍රවෘත්ති නරඹමින් සිටි තාත්තා විදෙස් පුවත් අවසන් වනවාත් සමඟ එතැනින් නැගිට ගියේ ය.

.................................................................................................................................

II බුදුන් වහන්සේ ජීවමාන සමයේ වැඩිපුර ම කාලය ගත කළේ බොහෝ ජනයාගේ හිතසුව පිණිස ය.

.................................................................................................................................

III සිංහල භාෂා තරගයට සූදානම් වන සිසුන් හෙළ බස හා ව්‍යාකරණ පිළිබඳ දැනුම ප්‍රගුණ කළ යුතුය.

.................................................................................................................................

IV දන්ත ධාතූන් වහන්සේ වැඩ සිටින දළදා මාලිගය පිහිටා ඇත්තේ මහනුවර නුවර වැව සමීපයේ බව සීයා අපට පැවසීය.

.................................................................................................................................

V දිළිඳු නිවසක හැදී වැඩුණු ඔහු මහා මැදුරක හිමිකාරිත්වය දක්වා ගමන් කළේ ඔහු තුළ පැවති නොපසුබට උත්සහය නිසාවෙනි.

.................................................................................................................................

05. (1) පහත සඳහන් ඉඟි වැකිවලින් හැඟවෙන අදහස ලියන්න

I කන්දොස්කිරියාව - ............................................................

II ඇමගිල්ලා - ............................................................

III උල්පන්දම් දෙනවා - ............................................................

IV අනුනවයෙන් බේරුණා - ............................................................

V කර අරිනවා - ............................................................

(ලකුණු 1X 5 = 05 යි)

(2) හිස් තැනට සුදුසු පද යොදා ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

I මඬේ හිට වූ ..................................................................

II අතුකඩා ..................................................................

III ඉබ්බා දියේ ..................................................................

IV ගමරාළගේ ..................................................................

V කටුස්සගේ කරේ ........................................................

(ලකුණු 1X 5 = 05 යි)

06. (1) හිස්තැනට සුදුසු පද යොදා යුගල පද සම්පූර්ණ කරන්න.

I මුදල් ..................................

II ඔප්පු ..................................

III ණය ..................................

IV ඇඳුම් ................................

V වට්ටි....................................

(ලකුණු 1X 5 = 05 යි)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(2) පහත දැක්වෙන උක්ත පදවල අනුක්ත පද ලියන්න

I අපි . ..........................................
II වෛද්‍යවරු ..........................................
III ඔවුහු ..........................................
IV කුරුල්ලා ..........................................
V සහෝදරියක් ..........................................

(ලකුණු 1X 5 = 05 යි)

07. පහත සඳහන් යෙදුම්වලට සුදුසු තනි පද තිත් ඉර මත ලියන්න.

I නියම ස්වරූපය සැඟ වී පවතින - ......................................................
II සිරිපා කරුණා කරන කණ්ඩායමේ නායකයා - ......................................................
III පැරණි භාණ්ඩ ප්‍රදර්ශනයට තබා ඇති ස්ථානය - ......................................................
IV රාත්‍රියේ හැසිරෙන - ......................................................
V නැවත සකස් කිරීම - ......................................................

(ලකුණු 1X 5 = 05 යි)

08. නිවැරදි පදය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

I ඊයේ සවස මම ප්‍රදර්ශනය නැරඹීමට ............................................ (යමි /ගියෙමි )
II කුරුල්ලෝ කූඩුවලින් ................................................ ( නික්මෙයි / නික්මෙති)
III ගංගාවෝ මුහුදට ගලා ............................................. (බසියි / බසිති )
IV ඈ ගී ගයමින් සභාව .......................................... ( පිනවූයේ ය / පිනවූවා ය )
V ඇතමෙක් බටහිර සිරිත් හිස මුදුනින් පිළිගෙන .............................. ( කටයුතු කරයි / කටයුතු කරති )
VI (උපාසිකාව / උපාසිකාවන් ) ..................................... මල් නෙළමින් වට්ටියට එකතු කළා ය.
VII (ශිෂ්‍යාවෝ / ශිෂ්‍යාවන් ) ................................ පිළිගැනීමේ ගීතය ගායනා කළහ.
VIII ( පියාණෝ / පියාණන් ) ............................................දරුවන් වෙනුවෙන් යුතුකම් ඉටු කරති.
IX (නුඹ /නුඹලා) ............................................ කඳු නැගීමෙන් වෙහෙසට පත් වූවෙහු.
X දුම්රිය ( මගීන් /මගීහු ) ........................ වෙහෙස නිවාගැනීමට අල්ලාප සල්ලාපයේ යෙදෙති.

(ලකුණු 1X 10 = 10 යි)

## II කොටස

09. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

එක් පුද්ගලයෙකු විසින් තවත් පුද්ගලයෙකු හෝ පුද්ගලයින් සමඟ අදහස් හුවමාරු කර ගැනීම සන්නිවේදනය වෙයි. මානව සම්භවය තරම් පැරණි වූ සන්නිවේදනයේ සරල අවස්ථාව වූයේ භාෂණය , ලේඛනය හා සංඥාව යි. ශිෂ්ටාචාරයේ දියුණුවත් සමඟ සන්නිවේදන මාධ්‍ය හා ක්‍රමවල විකාශයක් ඇති විය.පොත, පුවත්පත් , සඟරාව , ගුවන් විදුලිය , සිනමාව , රූපවාහිනිය අද සන්නිවේදන මාධ්‍ය වන අතර මෑත කාලයේ දී පරිගණකය ඩිජිටල් තාක්ෂණය සහ අන්තර්ජාලය නවතම සන්නිවේදන මාධ්‍ය බවට පත් වී හමාර ය. සන්නිවේදනයේ දියුණුව හරහා එදා මෙදා තුර මුළු ලෝකය ම විශ්ව ගම්මානයක් බවට පත් වී ඇතැයි කිව හැක්කේ එක් දේශයක සිටින පුද්ගලයෙකු සමඟ ඇසිල්ලකින් පණිවිඩ හුවමාරු කිරීමේ හැකියාව උදා වී ඇති බැවිනි.

I ඉහත ඡේදයට අනුව සන්නිවේදනය යනු කුමක් ද ?
..........................................................................................................................

.................................................................

II සන්නිවේදනයේ මූලික ම අවස්ථාව කුමක් ද ?

...........................................................................................................................

III වත්මන් සන්නිවේදන මාධ්‍ය ලෙස මෙහි සඳහන් වන්නේ මොනවා ද ?

...........................................................................................................................

...........................................................................................................................

IV සන්නිවේදනයේ දියුණුවත් සමඟ ලෝකය ම විශ්ව ගම්මානයක් බවට පත් වී ඇතැයි කිව හැක්කේ කුමක් නිසා ද ?

...........................................................................................................................

...........................................................................................................................

V මෙම අර්ථ දෙන වචන ඡේදය තුළින් තෝරා ලියන්න

(1) අලුත් ම - .....................................................

(2) ක්ෂණයකින් - .....................................................

(ලකුණු 4X 5 = 20 යි)

10. පහත දැක්වෙන පැදි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

මිනිසා නඟන කටහඬ නොම වැටෙන කනේ
ඇත මේ කුරුලු කූඩුව උඩ ගසක බෙණේ
නැත උවදුරක් මෙහි මෙතුවක් පහළ වුණේ
පැටවගේ කුඩා දෙනෙතට නිල් අහස පෙනේ

උණුසුම් ගතිය ඇතිමුත් සිය කැදැල්ලෙහි
පැටවා අකමැතිය හිර වී ඉදිල්ලෙහි
දෙනෙතට නිල් අහස යොමුවන ඇසිල්ලෙහි
ඔහු යෙදෙනවා නිදහස ගැන සෙවිල්ලෙහි

මව්පිය කුරුල්ලන් රැකවරණය ඇතුව
උන්ගේ ආලයේ වෙසෙතත් ගජ මුතුව
පැටවගේ දෙනෙතට පවතී කවදත් රතුව
සැපතක් ඔහුට නැත ඉගිලෙන්නට නැතුව

I පද්‍ය පන්තියට සුදුසු මාතෘකාවක් යෝජනා කරන්න.

...........................................................................................................

II මෙහි සඳහන් කුරුලු කූඩුව ඇත්තේ කෙබඳු පරිසරයක ද ?

...........................................................................................................

III කුරුලු පැටවා නිදහස ගැන සෙවිල්ලෙන් පසුවන්නේ කුමන අවස්ථාවක ද ?

...........................................................................................................................

IV කුරුලු පැටවාට දෙමාපිය සෙනහස නොඅඩුව ලැබුණු බවට හෙළිවන අවස්ථාවක් උපුටා දක්වන්න.

...........................................................................................................................

V කුරුලු පැටවාගේ දෙනෙත රතු වී ඇත්තේ කුමක් නිසා ද?

...........................................................................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**සිංහල භාෂාව හා සාහිත්‍යය තරගාවලිය 2023**

**කලාප මට්ටම**

**භාෂා භාවිතය හා අවබෝධය**

**08 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

- අපේක්ෂකයාගේ නම :- ....................................................................................................
- විදුහලේ නම සහ ලිපිනය:-.....................................................................................................
- කලාපය:- ....................................................................................................................
- පාසල් වර්ගය:-200 තෙක්/ 201 සිට 500/ 500 ට වැඩි.

I සහ II යන කොටස්වල ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

**I කොටස**

01. නිවැරදි අක්ෂර වින්‍යාසය යෙදී ඇති පදය තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

i. කොට්ඨාශය , කොට්ඨාසය , කොට්ටාසය

ii. ඥාන සම්භාරය , ඥාන සම්බාරය , ඥාන සම්බාරය

iii. විචක්න , විචක්ශන , විචක්ෂණ

iv. සාම්ප්‍රදායික , සාම්ප්‍රධායික , සාම්ප්‍රධායිඛ

v. භාෂා වියවහාර , භාශා ව්‍යවහාර , භාෂා ව්‍යවහාර

vi. පරිසණකය , පරිගණකය , පරිසනකය

vii. අක්ෂිදාන , අක්ෂිධාන , අක්ශිදාන

viii. ශබ්ධකෝෂය , ශබ්දකෝෂය , සබ්ද කෝෂය

ix. ජනශ්‍රැතිය , ජනසෘතිය , ජනශ්‍රැථිය

x. ත්‍යාග ප්‍රධානය , ත්‍යාගප්‍රදානය , ත්‍යාග ප්‍රදාණය

(ලකුණු 1X 10 = 10)

02. පහත නම් සඳහන් ප්‍රස්තාව පිරුළු නිවැරදි ව ගළපා ලියන්න.

I යකඩෙ තළනව ලු ආචාරියා උඩ පැන පැන තැලෙන දැක්ක ම

.................................................................................................................................

.................................................................................................................................

II වගෙයි හැළුණු තටු පක්ෂියා

.................................................................................................................................

III වේ ද කන්දක් බිරුවාට මීටි බල්ලෙ ක්

.................................................................................................................................

IV වගේ කිච්චා මිදි නරියා තිත්තයි.

.................................................................................................................................

V වගේ දීලා මිරිස් ඉගුරු ගත්තා

.................................................................................................................................

(ලකුණු 1X 5 = 05)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

03. හිස් තැනට සුදුසු පද යොදා පහත සඳහන් යුගල පද සම්පූර්ණ කරන්න.

I ............................................... විරිත්

II ............................................. හෝම

III ලට්ට .................................................

IV භාර ....................................................

V ............................................. දෙහින

(ලකුණු 1X 5 = 05)

04. මුලින් දී ඇති පදයට සමානාර්ථවත් පදයක් හා විරුද්ධාර්ථවත් පදයක් ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.

| | | සමානාර්ථ | විරුද්ධාර්ථ |
|---|---|---|---|
| I | දීර්ඝ | - ......................................... | ......................................... |
| II | දේශිය | - ........................................ | .......................................... |
| III | මග | - .......................................... | .......................................... |
| IV | දුලභ | - ............................................ | .......................................... |
| V | උදක | - ........................................... | .......................................... |

(ලකුණු 2X 5 = 10)

05. පහත සඳහන් පද අකාරාදී පිළිවෙළට සකස් කර ලියන්න.

I බදුල්ල , අනුරාධපුරය , ගාල්ල , කළුතර

.........................................................................................................................................

II කොක්ක , කුල්ල , කැත්ත , කමත , කාසිය

..........................................................................................................................................

(ලකුණු 1X 2 = 2)

06. පහත සඳහන් පද විවිධ අර්ථවල යොදා ව්‍යාකරණානුකූල වාක්‍ය දෙක බැගින් ලියන්න.

I පිය

(අ)..........................................................................................

(ආ) ..........................................................................................

II නා

(අ) ........................................................................................................

(ආ) .......................................................................................................

(ලකුණු 2X 2 = 4)

07. පහත සඳහන් වාක්‍යවල අදාළ තැන්හි විරාම ලකුණු යොදා වාක්‍යය නැවත ලියන්න.

(අ) i අනේ බුදු ගමහාමුදුරුවනේ මාව මරන්න එපා

.......................................................................................................................

ii ඇත්ත තමයි අර බලහල්ලකො බලු කුක්කෙක් වගේ හැංගිලා ඉන්න හැටි

.........................................................................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(ලකුණු 1X 2 = 2)

(ආ) පහත සඳහන් ක්‍රියාපද අයත් වන ක්‍රියා වර්ගය ඉදිරියෙන් ලියන්න.

I කියන්න - ..........................................................

II සැනසෙම්වා - ..........................................................

III බලා - ..........................................................

IV කියමින් - ..........................................................

(ලකුණු ½ X 4 = 2)

(ඉ) පහත දැක්වෙන අක්ෂර හඳුන්වන නම් ලියන්න.

i. ඔ - ..........................................................

ii. ෂ - ..........................................................

iii. ශ - ..........................................................

iv. ස - ..........................................................

v. ළ - ..........................................................

(ලකුණු 1 X 5 = 5)

(ඊ) නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.

i. ගුණ නාම පදයකි ..........................................(මහලු ,දිය , ඕලු)

ii. “වඳිමි ” යන පදයෙහි බහු වචන අතීත කාල ක්‍රියා රූපය .......................................

( වඳිමු , වැන්දෙමු , වඳින්නෙමු)

(ලකුණු 1 X 2 = 2)

(උ) 1. පහත සඳහන් පදවල අනුක්ත රූප ලියන්න

i. මැණියෝ - ................................

ii. සිසුවෙක් - ...................................

iii. ලේඛිකාවක් -....................................

II පහත සඳහන් යෙදුම්වල අර්ථය ලියන්න.

i. අටසාළිස් - ....................................

ii. අමයුරු -......................................

iii. පුරාණෝක්ති - .....................................

(ලකුණු ½ X 6 = 3)

08. (අ) පහත සඳහන් වාක්‍ය නිවැරදි කර ලියන්න.

I. කුරුල්ලෝ කෑදලි කරා පියාඹා යයි

..........................................................................................................................................

II. වෙළෙන්දන් බඩු විකුණති.

..........................................................................................................................................

III. තාත්තා ද නංගී ද මම ද විනෝද චාරිකාවක් ගියෙමි.

..........................................................................................................................................

IV. ඔබ සිංහල භාෂා තරග සඳහා ඉදිරිපත් වන්නෙහු ද ?

..........................................................................................................................................

V. අප ගුරුවරයා දැක හුනස්නෙන් නැගී සිටියෙමු.

..........................................................................................................................................

(ලකුණු 1 X 5 = 5)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(ආ) සුදුසු පදය වරහන තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

I ගුරුවරු (සිසුහු / සිසුන් ) යහමග යවති.

II සිංහයා (මුවකු / මුවෙක් ) මරයි.

III (ළමයි / ළමයින්) සෙල්ලම් කරති.

IV (වෘක්ෂලතා වෝ / වෘක්ෂලතා ) වනය අලංකාර කරයි.

V දෙමාපියෝ ( ගුරුවරු / ගුරුවරුන් ) හමුවූහ.

(ලකුණු 1 X 5 = 5)

## II කොටස

09. පහත දැක්වෙන කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සමන් පිච්ච මල් ඉහිරුණු - නිල් තණකොළ පිට්ටනියක්
වගෙයි අහස අන්න බලනු - කොච්චර ලස්සන ද රෑට

බකමුණෝ පියාඹති - අනික් කුරුල්ලෝ නිදති
බෝ අතුවල එල්ලීගෙන - මා වවුලෝ කෑ ගසති

මගේ සුරතල් අක්කගේ - මාලය මුතු ඇට වගේ
මේ වැටෙන්නේ පිනි බින්දුයි - හදමු එකක් ඒ වාගේ

හඳහාමි අප දිහාව - එබී බලයි පා හිනාව
සිහිල් සුළං දැල් විදින්ට - දොරට යන්ට හොඳ වෙලාව

අහසේ තරුවැල් පිපිලා - පොළොවේ සුදු මල් පිපිලා
මගුල් ගෙවල් දෙකක් වගෙයි - මේ දෙපල ම හැඩ ගැහිලා

I රාත්‍රි අහස කවියා සමාන කර දක්වන්නේ කුමකට ද?

.......................................................................................................................................

II එක් එක් කුරුලු වර්ගය කුමක් කරමින් සිටිත් දැයි වෙන් වෙන් ව ලියන්න.

.......................................................................................................................................

III තුන්වන කවියේ ඇති උපමාව හා උපමේය වෙන් කොට ලියන්න.

.......................................................... ..........................................................

IV මෙහි අහස සහ පොළොව කුමක් ලෙස සඳහන් කර ඇත් ද?

.......................................................................................................................................

V කවි පන්තියේ සඳහන් වර්තමාන කාල බහු වචන ආඛ්‍යාත පද දෙකක් හා නාම විශේෂණ පද දෙකක් ලියන්න.

.......................................................... ..........................................................

(ලකුණු 4 X 5 = 20)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

10. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සත්ත්ව විද්‍යාඥයන් විසින් දීර්ඝ කාලයක් තිස්සේ කරන ලද විවිධ පර්යේෂණවල ප්‍රතිඵලයක් වශයෙන් මනුෂ්‍යයා හා වානරයා අතර සමීප සම්බන්ධතාවක් ඇති බව හෙළි වී තිබේ. වානර වර්ගයා ගැන කරන ලද සූක්ෂ්ම සොයා බැලීම් පාදක කොට ගෙන චිම්පන්සීන් යනු මහා වානරයාගේ විශේෂිත උප සත්තව කොට්ඨාසයක් ය යන නිගමනයට පැමිණ ඇත.සෙසු වානරයන්ගේ මෙන් ම චිම්පන්සීන්ගේ ද විශේෂිත ජන්ම භූමිය අප්‍රිකාවේ මහා වනාන්තර ප්‍රදේශ යැයි කියනු ලැබේ. නූතන සංවර්ධනයට ඉඩදෙනු වස් මේ ඝන වනාන්තර ක්‍රමයෙන් එළි පෙහෙළි වීමට භාජනය වීම නිසා චිම්පන්සීන් ඇතුළු වානර කුලයේ සත්ත්වයන්ට පමණක් නොව සෙසු වන සතුන්ට ද යන එන මං නැති වී යන තැනට හෙවත් තම පාරම්පරික ජන්මභූමියේ උරුමය අහෝසි වී යන තැනට විවිධ සාධක මතු වී ගෙන එයි.මිනිසා හා චිමපන්සියා යන මේ සත්ත්ව විශේෂ දෙක අතර පවත්නා ජාන පරම්පරාව බොහෝ දුරට සමාන යැයි ජාන විද්‍යා පර්යේෂණවලින් හෙළි වී ඇත්තේ ය.

I සත්ත්ව විද්‍යාඥයන්ගේ විවිධ පර්යේෂණවලින් හෙළි වී ඇති කරුණක් ලෙස මෙහි සඳහන් වී ඇත්තේ කුමක් ද?

..............................................................................................................................

II මහා වානරයාගේ විශේෂිත උපසත්ත්ව කොට්ඨාසයට අයත් වන්නේ කවරහු ද ?

..............................................................................................................................

III චිම්පන්සීන්ගේ ජන්ම භූමිය වූයේ කුමන ප්‍රදේශය ද ?

..............................................................................................................................

IV වන සතුන්ගේ පාරම්පරික ජන්ම උරුමය අහෝසි වීමට බල පෑ හේතු කුමක් ද?

..............................................................................................................................

..............................................................................................................................

V ජාන විද්‍යා පර්යේෂණවලින් හෙළි වී ඇති කරුණ කුමක් ද ?

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

(ලකුණු 4 X 5 = 20)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**සිංහල භාෂාව හා සාහිත්‍යය තරගාවලිය 2023**

**කලාප මට්ටම**

**භාෂා භාවිතය හා අවබෝධය**

**09 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

- අපේක්ෂකයාගේ නම :- ..............................................................................................
- විදුහලේ නම සහ ලිපිනය:-..............................................................................................
- කලාපය:- ..............................................................................................
- පාසල් වර්ගය:-200 තෙක්/ 201 සිට 500/ 500 ට වැඩි.

**I සහ II යන කොටස්වල ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

**I කොටස**

01. පහත සඳහන් වාක්‍යවල සදොස් අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරා , එම පදය පමණක් නිදොස් කර තිත් ඉර මත ලියන්න.

I දේශාභිමානී සාහිත්‍ය නිර්මාණ වැඩි වශයෙන් ම රචනා වූයේ කොළඹ අවදියේ මුල් වකවානුවේ දී ය.
..............................................................................................

II ආර්.එල්. බ්‍රොහියර් මහතා කාළාන්තරයක් තිස්සේ ගන වනයේ සැඟව තිබූ අවුකන බුදුරුව දැකීමෙන් විස්මයට පත් විය.
..............................................................................................

III මධ්‍යකාලීන සිංහල කලා කෘතියේ ප්‍රස්ථාවනාවෙහි කතුවරයා සිය අරමුණ දක්වා ඇත.
..............................................................................................

IV ළමයින්ගේ කියවීම සහා සම්පාධනය කෙරෙන ගද්‍ය, පද්‍ය. නාට්‍ය ආදි නිර්මාණ ළමා සාහිත්‍යයට අයත් වේ.
..............................................................................................

V රියදුරා විසින් රථය පනගන්වන ලදි
..............................................................................................

VI පැරණි අධ්‍යාපන ක්‍රමයෙහි දී ශබ්ද නිවැරදි ව උච්චාරණයට ශිෂ්‍යයා පුහුණු කරවීම කෙරෙහි වැඩි අවධානයක් යොමු විය.
..............................................................................................

VII සංඛ්‍යා ලේඛණ ඉදිරිපත් කිරීමේ දි හැකිතාක් සරල වගු සහ චිත්‍රක රූප භාවිත කළ යුතු ය.
..............................................................................................

VIII පණිභාරතයන්ගේ සෙවණෙහි හැදුණු වැඩුණු සිසු දරු දැරියන් ගේ ශිර්ෂ ප්‍රනාමය එතුමා ලද උතුම් ම සම්මානය යි. ..............................................................................................

IX භාෂාවක ඇති චතුර්විධ කුශලතා ලෙස සවන්දීම , කතා කිරීම , කියවීම හා ලිවීම හඳුන්වා දිය හැකි ය.
..............................................................................................

X ළමා සාහිත්‍ය නිර්මාණයක් කිරීමේ දී සැළකිලිමත් විය යුතු කරුණු බොහෝ ය.
..............................................................................................

(ලකුණු 1 X 10 = 10)

02. වරහන් තුළ දී ඇති පද නිවැරදි ව තෝරා හිස් තැන් සම්පූර්ණ කරන්න.

( ව්‍යවහාර , ජීවිතාවබෝධය, කාර්යභාරය , නිරන්තරයෙන් , කාර්යක්ෂමතාවට )

I පරිසරය හා ළමයා අතර සබඳතාව ගොඩනැංවීමේ ලා ළමා සාහිත්‍යයේ ...................................... සුවිශේෂ වේ.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

II වාණිජකරණය නිසා පරිහානියට පත් දේශීය කලා සම්ප්‍රදාය රැක ගැනීමේ අගය කුමාරස්වාමි මහතා ...................................................... වටහා දුන්නේ ය.

III මුඛ පරම්පරාගතව ඉදිරියට ගෙන ආ පොදුජනතාවගේ ...................................................... භාෂාවේ පොහොසත්කම පෙන්වාදීමට ප්‍රස්තාව පිරුළු කදිම නිදසුනකි.

IV පරිගණකය මගින් තොරතුරු සන්නිවේදනය අපේ කාර්යයන්හි ............................................. ප්‍රබල ලෙස බලපායි.

V කවිය යනු මිනිසාගේ ............................................ පුළුල් කරන සාහිත්‍යාංගයකි.

(ලකුණු 1 X 5 = 5)

03. පහත දැක්වෙන පදවල ප්‍රකෘතීන් ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.

I කුරුල්ලා - ..............................................

II පැන - .............................................

III මුහුද - ..............................................

IV ළමයා - ...............................................

V සතුරා - ...............................................

(ලකුණු 1 X 5 = 5)

04. පහත දැක්වෙන පද අයත් වන ව්‍යාකරණ වර්ගය කුමක්දැ යි ඉදිරියෙහි ඇති තිත් ඉර මත ලියන්න.

I බැලෙමි - ...............................................

II කැටුව - ...............................................

III ගොස් - ...............................................

IV නටද්දී - ...............................................

V අඬවයි - ................................................

(ලකුණු 1 X 5 = 5)

05. පහත සඳහන් එක් එක් පදයට යෝග්‍ය සමානාර්ථවත් පදය හා විරුද්ධාර්ථවත් පදය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.

| | | සමානාර්ථවත් පදය | විරුද්ධාර්ථවත් පදය |
|---|---|---|---|
| I | ආලෝකය | ...................................... | ........................................... |
| II | නව | ...................................... | ........................................... |
| III | කැමති | ...................................... | ........................................... |
| IV | සතුට | ...................................... | ........................................... |
| V | ප්‍රකට | ...................................... | ............................................ |

(ලකුණු 1 X 5 = 5)

06. (අ) පහත දැක්වෙන කර්තෘ කාරක වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

I ගොවියෝ කුරුල්ලන් එළවති.

.....................................................................................................................

II විචාරකයෝ ලේඛිකාව පසසයි.

.....................................................................................................................

III පුතා පොත් කියවයි.

.....................................................................................................................

IV මම චිත්‍රයක් ඇන්දෙමි.

.....................................................................................................................

V වෛද්‍යවරු රෝගීන් සුවපත් කරති.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

.............................................................................................................................

(ලකුණු 1 X 5 = 5)

(ආ) පහත සඳහන් වාක්‍ය කර්තෘකාරකයට හරවා ලියන්න.

I මව විසින් දරුවෝ ඇගයෙති.

.....................................................................................................................................

II සොයුරිය විසින් සුරතල් සත්තු ඇති කෙරෙති.

.....................................................................................................................................

III කුරුල්ලන් විසින් තම පැටවු ආරක්ෂා කෙරෙති.

.....................................................................................................................................

IV නංගි විසින් මල් කැඩිණි.

.....................................................................................................................................

V ගුරුවරයා විසින් ශිෂ්‍යයෝ යහමග යැවෙති.

.....................................................................................................................................

(ලකුණු 1 X 5 = 5)

07. (අ) පහත සඳහන් ප්‍රස්තාවපිරුළු හා ආප්තෝපදේශවලට ගැළපෙන පද යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න

I ........................................................... අග්ගලාවත් කජ්ජක් ද?

II මුව හමට ............................................................ වගේ.

III ........................................................... දැවැද්දට අස්සයා දුන්නා වගේ.

IV වාගේ එක්ක තරහට ........................................................................ වගේ.

V ........................................................... පිටිකර බෙහෙත් බැන් දා වගේ.

(ලකුණු 1 X 5 = 5)

(ආ) පහත සඳහන් රූඩි පදවල අර්ථය ඉදිරියෙන් ලියන්න.

(i) උල්පන්දම් දෙනවා - ...................................................................................................

(ii) ඇම ගිල ලා - ...................................................................................................

(iii)හතර බිහිරි කතාවක් - ...................................................................................................

(iv) අං ඇවිල්ලා - ...................................................................................................

(v)ඉබ්බාගෙන් පිහාටු ඉල්ලනවා වගේ - ...................................................................................................

(ලකුණු 1 X 5 = 5)

08. (අ) පහත සඳහන් යෙදුම් සඳහා තනි පද ලියන්න.

I කිසිවෙකුට දෙවැනි නො වන - ..........................................................................

II දුර දිග බලා කටයුතු කරන - ..........................................................................

III කෙළෙහි ගුණ නොසලකන - ..........................................................................

(ලකුණු 2 X 3 = 6 )

(ආ) පහත සඳහන් ක්‍රියාපද ප්‍රයෝජ්‍ය ක්‍රියා පද බවට හරවා අර්ථවත් වාක්‍ය බැගින් නිර්මාණය කරන්න.

(i ) කියමි (ii ) කඩයි

I .....................................................................................................................................

II .....................................................................................................................................

(ලකුණු 2 X 2 = 4 )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

II කොටස

09. පහත පද්‍ය පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

රෑ පානේ තල්ගස් වල පොළට ඇදෙන බර බාගෙක
ලන්තෑරුම් එළිය පෙනී හිත පෑරී හඬන පැයෙක
ඇතුමල් පාලම පසු කොට එදා කීයු සි පදයක
දෝංකාර හඬ සිහිනෙන් මෙන් ඇසුණා දුර ඈතක

පිරිත පුරන හඬ මතුවෙයි නා ගහ පන්සල පෙදෙසින
බක් මී මල් සුවඳක් ඇල ලන්ද දිගේ එයි දුවගෙන
බොහෝ ඈත දුර දවසක ඇය හා සුදු මානෙල් ගෙන
ගිය ගමනක මිහිර හිතේ පැටලී කඳුලක් ඉපදෙන

I ලන්තෑරුම් එළිය දක්නට ලැබුණේ කුමකින් ද ?

……………………………………………………………………………………..

……………………………………………………………………………………..

II දුර ඈතකින් අසන්නට ලැබුණේ යැයි කවියා පවසන්නේ කුමක් ද ?

…………………………………………………………………………………….

…………………………………………………………………………………….

III නා ගහ පන්සල පැත්තෙන් කුමක් ඇසුණේ ද?

…………………………………………………………………………………….

…………………………………………………………………………………….

IV “ බක් මී මල් සුවඳක් ඇල ලන්ද දීගේ එයි දුවගෙන ” පද්‍ය පාදයෙන් කියවෙන අදහස ලියන්න ?

………………………………………………………………………………………..

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

V කවියාගේ ඇසට කඳුලක් ඉපදීමට හේතුව වී ඇත්තේ කුමක් ද ?

………………………………………………………………………………………..

………………………………………………………………………………………..

(ලකුණු 4 X 5 = 20 )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

10. ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවල ට පිළිතුරු ලියන්න.

මහා වංශයේ සඳහන් වන පරිදි මෙරට මුල් ම වැව ඉදිකර ඇත්තේ කිතුවසින් පන්සිය වසරකට පමණ පෙර " අනුරාධ " නමින් ජනපදයක් පිහිට වූ පළමු ව අනුරාධ නම් ඇමතිවරයා යි.නමක් සහිත වැවක් ගැන ලිඛිත ඉතිහාසයේ පළමු ව සඳහන් වන්නේ ' පණ්ඩුකාභය ' රජ සමයේ ය.සිය මාමා වරුන් පරාජය කර රජ බවට පැමිණි පණ්ඩුකාභය කුමරු අනුරාධපුරය ගොඩනංවා එහි අභය නමින් වැවක් ද ඉදි කළේ ය.දැනට අනුරාධපුරයේ රුවන්වැලි මහා සෑයට නුදුරින් ' බසවක්කුලම' වශයෙන් හැඳින්වෙන්නේ එයයි.දේවානම්පියතිස්ස , මහා නාග, සද්ධා තිස්ස , මකලන් තිස්ස, ආමණ්ඩගාමිනී, වන්දමුඛසීව , යන රජවරුන් මෙරට වාරිකර්මාන්තයේ ආරම්භක ශ්‍රේෂ්ඨයන් බව ලක් ඉතිහාසයෙන් සනාථ වේ.ශ්‍රී ලංකාව සහලින් ස්වයංපෝෂණය කිරීම සඳහා වී වගාවට අත්‍යවශ්‍ය වන ජල සම්පාදනයට මූලික අඩිතාලම වූ වැව් තැනවීම ලාංකේය රාජ්‍ය පාලකයන්ගේ වැදගත් ම රාජ්‍ය ප්‍රතිපත්තියක් වූ බව පෙනේ." අහසින් වැටෙන ජලය බිඳකුදු ගොවිතැන් කරන කුඹුරු වෙත නොයවා , අපතේ යාමට ඉඩ නොහරින බවට " මහා පැරකුම් රජතුමා ප්‍රතිඥා දුන් බව කියනු ලැබේ.

I මෙරට මුල් ම වැව ඉදිකළේ කවු ද? එය ඉදි කර ඇත්තේ කුමන කාලයක ලෙස මෙහි කියවේ ද ?

.......................................................................................................................................

.......................................................................................................................................

II නාම කරණය වූ වැවක් පිළිබඳ ව මුලින් ම සඳහන් වන්නේ කුමන රාජ සමයක ද? එම වැව කුමක් ද?

.......................................................................................................................................

.......................................................................................................................................

III මෙරට වාරි තාක්ෂණයේ ආරම්භක ශ්‍රේෂ්ඨයන් සිව් දෙනෙකු නම් කරන්න .

............................................................... ...............................................................

............................................................... ...............................................................

IV වැව් තැනවීම ලාංකීය රාජ්‍ය පාලකයන් ගේ වැදගත් ම රාජ්‍ය ප්‍රතිපත්තිය වීමට හේතුව කුමක් ද?

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

V මහා පරාක්‍රමබාහු රජතුමා දුන් ප්‍රතිඥා ව කුමක් ද?

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

(ලකුණු 4 X 5 = 20 )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**සිංහල භාෂාව හා සාහිත්‍යය තරගාවලිය 2023**

**කලාප මට්ටම**

**භාෂා භාවිතය හා අවබෝධය**

**10 ශ්‍රේණිය** **කාලය පැය 03 යි.**

- ❖ අපේක්ෂකයාගේ නම :- ..........................................................................................
- ❖ විදුහලේ නම සහ ලිපිනය:-..........................................................................................
- ❖ කලාපය:- ..........................................................................................
- ❖ පාසල් වර්ගය:-200 තෙක්/ 201 සිට 500/ 500 ට වැඩි.

**I , II හා III යන කොටස්වල ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

**I කොටස**

01. අක්ෂර වින්‍යාසය සදොස් ලෙස යෙදී ඇති වචනය තෝරා එය පමණක් නිදොස් කර තිත් ඉර මත ලියන්න.

I ආපදා වැළැක්වීමටත් පුනරුත්තාපන කටයුතු සඳහාත් නීති පද්ධතියක් සකස් විය යුතු ය.

..........................................................................................

II ශ්‍රී ලංකාව ට ගැළපෙන ඖෂධ ප්‍රතිපත්තියක් සැළසුම් කිරීම වැදගත් ය.

..........................................................................................

III ඔබට අභිමත සෛලියකින් පොත කියවන්න.

..........................................................................................

IV විත්තියෙන් හා පැමිණිල්ලෙන් ඉදිරිපත් කළ කරුණුවලට අධිකරනය ප්‍රවේසමෙන් කන්දුන්නේ ය.

..........................................................................................

V එය ප්‍රාථමික පාඨසාලාවක් සඳහා ඉදි කළ ගොඩනැගිල්ලකි.

..........................................................................................

VI අයිතිහාසික තොරතුරු රැසක් පැරණි සෙල්ලිපිවලින් සනාථ වෙයි.

..........................................................................................

VII විශේශාංග ලිපියක ආරම්භය ආකර්ෂණශීලී විය යුතු ය.

..........................................................................................

VIII පරිකල්පනය මඟින් ගොඩ නැඟු යතාර්ථය නිර්මාණයේ අන්තර්ගතය වේ.

..........................................................................................

IX වන්දිභට්ටයෝ රජවරුන් උදෙසා ප්‍රසස්ති ගායනා කරති.

..........................................................................................

X විරාම ලක්ෂණ , ලේකනයේ දී අත්‍යවශ්‍යා සංකේතයන් ය.

..........................................................................................

(ලකුණු 1/2 X 10 = 05 )

02. (අ) පහත දැක්වෙන එක් එක් යෙදුම්වලින් කියැවෙන අදහස්වලට ගැළපෙන ප්‍රස්තාව පිරුළ වරහන් තුළින් තෝරා ලියන්න..

I වාසි පැත්තට කවුරුත් හිතවත් ව කතා කිරීම

..........................................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

II දැකීමට කොහෙත්ම අකමැති වීම
..........................................................................................................................
III කලක් සතුරු ව සිටි අය පවා පසුව මිතුරන් වන බව
..........................................................................................................................
IV ඉතා පහසුවෙන් හා ඉතා ඉක්මනින් කිරීම.
..........................................................................................................................
V උදව්වක් කර යමක් බලාපොරොත්තු වීම
..........................................................................................................................

( පුවක් ගහෙන් බහින්නා වගෙයි , කලක දී වහ කලක දී රස වෙනවාලු , දී කිරට බළල්ලුත් සාක්කි , අත දීලා දත නියවනවා , නයාට අඳුකොළ වගෙයි )

(ලකුණු 1/2 X 5 = 2 ½)

(ආ) පහත දැක්වෙන එක් එක් අර්ථයට අනුකූල රූඪීය ලියන්න.

I ඉතා සෙමින් වැඩ කිරීම - ..........................................................................

II ඇති වන්නට ගිය ලාභයට හානි කිරීම ..........................................................................

III ගෞරවය කෙලෙසුනා..........................................................................

IV බැන වැදුණා ..........................................................................

V ක්‍රියාත්මක නොවී තිබීම..........................................................................

(ලකුණු 1/2 X 5 = 2 ½)

03. පහත දැක්වෙන එක් එක් පදවලට යෝග්‍ය සමානාර්ථ පදය සහ විරුද්ධාර්ථ පදය ලියන්න.

| | | සමානාර්ථ පදය | විරුද්ධාර්ථ පදය |
|---|---|---|---|
| I | ප්‍රශංසාව | ............................................ | ............................................ |
| II | අඳුර | ............................................ | ............................................ |
| III | කීර්තිය | ............................................ | ............................................ |
| IV | උත්සහය | ............................................ | ............................................ |
| V | නවීන | ............................................ | ............................................ |

(ලකුණු 1/2 X 10 = 5)

04. පහත දැක්වෙන වාක්‍ය සදොස් නම් නිදොස් කොට ලියන්න.

I පියාණෝ අපට ඔවදන් දෙයි.
..........................................................................................................................
II අපක්ෂපාති නායකයෙකු පහළ වේවා
..........................................................................................................................
III කම්කරුවන් පස්දෙනෙක් මාර්ගය පවිත්‍ර කරති.
..........................................................................................................................
IV නංගි නොහොත් මල්ලී අම්මාට උදව් වූහ.
..........................................................................................................................
V ඕ තොමෝ විහාරස්ථානයට ගියේය.
..........................................................................................................................

(ලකුණු 1 X 5 = 5)

05. පහත සඳහන් කර්තෘ කාරක වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.

I ඔවුහු කඳු මුදුනට තොරොක්කෝව තල්ලු කළහ.
..........................................................................................................................
II විනිසුරුතුමා සැකකරුවන් නිදහස් කරයි.
..........................................................................................................................
III ටෙලි නාට්‍ය නිෂ්පාදකයෝ ප්‍රේක්ෂකයන් සතුටු කරති.
..........................................................................................................................
IV අපි නුඹ ආරක්ෂා කරන්නෙමු.
..........................................................................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

V මම නිරතුරුව පොත පත කියවමි.

..........................................................................................................

(ලකුණු 1 X 5 = 5)

06. පහත සඳහන් පද අයත් වන්නේ කවර ව්‍යාකරණ විධියකට දැයි ඉදිරියෙන් ලියන්න.

I ගියොත් - ..........................................................................

II නටනවා - .......................................................................

III පිණිස - ............................................................................

IV දුදන - ..........................................................................

V දැඟිලි - ........................................................................

VI බලා - ..........................................................................

VII ගසක් - ..........................................................................

VIII සමහරු - ..........................................................................

(ලකුණු 1 X 8 = 8)

07. (අ)පහත සඳහන් පද අකාරදි පිළිවෙළට සකස් කර ලියන්න.

I රාජාල , කටුවල ,හිඟුරල , ඉන්නල

..........................................................................................

II විපුල් , විමල් , විහඟ , විපුලි

..........................................................................................

(ලකුණු 1 X 2= 2)

(ආ)පහත අක්ෂර වර්ග නම් කරන්න

I ය ,ර .ල , ව - ..................................................

II ක ,ච , ට , ත , ප - ..................................................

III ත , ථ , ද ,ධ , න , ල , ස - ..................................................

IV (අ)ඃ - ..................................................

(ලකුණු 1/2 X 4= 2)

(ඉ) පහත සඳහන් පද වල ප්‍රකෘති ලියන්න

I නටන්නී - ..................................................

II මුහුද -..................................................

III පහන - ..................................................

IV යහපත - ..................................................

(ලකුණු 1/2 X 4= 2)

(ඊ) පහත සඳහන් පාඨයන්හි පාද කළු අකුරින් මුද්‍රිත පද වල අර්ථය ලියන්න

කවියා භාෂාවේ ඇති මුළු **ශක්‍යතාවෙන්** ප්‍රයෝජන ගනියි.

..........................................................................................................

නූතන සාහිත්‍යකරුවා **චිරන්තන** සාහිත්‍ය කෘති පරිශීලනය කරයි.

..........................................................................................................

(ලකුණු 1/2 X 2= 1)

II කොටස

08. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

රටක් සංවර්ධනය වීමේ දී මිනිසුන්ට ලැබෙන ආදායම ශීඝ්‍රයෙන් ඉහළ යයි.එක් අතකින් පුද්ගලයන් වෙනුවෙන් දැරිය යුතු සමාජීය වියදම වැඩි වේ. ලංකාව වැනි රටවල ජනගහනය වර්ධනය වේගය ඉහළ

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

නිසා සුභ සාධන වියදම් ක්‍රමයෙන් වැඩි වෙයි.අනික් අතින් කර්මාන්ත සහ වෙනත් ව්‍යාපෘති වෙනුවෙන් වූ ප්‍රාග්ධන අවශ්‍යතා පිරිමැසිමේ දී ප්‍රාග්ධන වියදම් ඉහළ යයි.යම් කිසි ආයෝජනයක් හෝ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමත් සමඟම වැටුප් , බදු කුලි ,පොලී හා ලාභ යනා දී සාධක , ගෙවීම් ස්වරූපයෙන් මිනිසුන් අතට ආදායම ගලා යයි. එහෙත් එම ආයෝජනවල ප්‍රතිලාභ ලැබෙන්නේ කාලයක් ගත වූ පසුව යි.ආයෝජන කාලය හා ප්‍රතිලාභ ලැබෙන කාලය අතර පරතරයක් ඇත. මේ නිසා දියුණු වන රටවල නිතර ම මුදල් සැපයුම , භාණ්ඩ සැපයුමට වඩා වැඩි ය.මුදල් සැපයුමට සමානුපාතික භාණ්ඩ සැපයුමක් ඇති කිරීම මඟින් උද්ධමනය වළක්වා ගත හැකි ය. නමුත් දියුණු වන රටවල එය කළ නොහැකි ය . සංවර්ධන ව්‍යාපෘති දිගින් දිගට ම පවත්වාගෙන යන හෙයින් ඉහත කී පරතරය ද අඛණ්ඩ ව පවතී.

I. මෙම ඡේදයෙන් විස්තර වන්නේ කුමක් පිළිබඳව ද?

..................................................................................................................

..................................................................................................................

II. ලංකාවේ සුභසාධන වියදම් ක්‍රමයෙන් වැඩිවන්නේ ඇයි ?

..................................................................................................................

..................................................................................................................

III. දියුණු වන රටවල මුදල් සැපයුම , භාණ්ඩ සැපයුමට වඩා වැඩි වන්නේ කුමක් නිසා ද?

..................................................................................................................

..................................................................................................................

IV. උද්ධමනය වළක්වා ගත හැක්කේ කෙසේ ද?

..................................................................................................................

..................................................................................................................

V. මිනිසුන් අතට ආදායම් ලැබෙන සාධක මොනවා ද ?

..................................................................................................................

..................................................................................................................

(ලකුණු 4 X 5= 20 )

09. පහත සඳහන් පැදි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

යමු යමු සොඳුර රන්වන් හිරු එළිය සිප
රජදහනකට ඉගිලී යමු අපට කැප
වන දෙව්ලොවේ වලදන්නට සියලු සැප
ලස්සන කැදැල්ලක් බැඳගත යුතු ය අප

නිවහල් දිවි පෙවෙත අරඹා වන වාසී
නැළවෙමු මිනිස් කටහඬ කනකට නෑසී
සපයා පුළුන් මැටි පරඬැල් පෙද පාසී
ගෙය ගොඩ නැඟුම මහ වනයෙහි ම ය ලේසී

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

| | |
|---|---|
| ළංවිය නොහී ජනපද වල කුණු | කසළ |
| සුවජනක ව පෙනේ මිටියාවත | නිසල |
| අපි නිදහසේ හැසිරෙමු ඇළ දොළ | අසල |
| අපටත් සොඳුර පැදෙයි අප සතු | කුසල |
| | |
| මේ පරිසරය තුළ සැප පහසුවට | හිත |
| දිවි පෙවෙතකට අගහිඟ කිසිවෙකුදු | නැත |
| ගී කියමින් නටන්නට අතු රිකිලි | මත |
| හැම දං පඳුරක්ම මෙහි අප නමට | ඇත |

I. මෙම පැදිපෙළෙන් කියවෙන්නේ කුමක් පිළිබඳව ද ?

........................................................................................................................................

........................................................................................................................................

II. ජනපදවලට ළගාවිය නොහැක්කේ කුමක් නිසා ද?

........................................................................................................................................

........................................................................................................................................

III. මිනිස් සමාජය තම නිදහසට බාධාවක්යැයි හැඟවෙන කවි පදය තෝරා ලියන්න?

........................................................................................................................................

........................................................................................................................................

IV. ඔහුන්ගේ විනෝදාස්වාදය වඩාත් වැඩි වීමට බල පෑ හේතු දෙකක් ලියන්න ?

........................................................................................................................................

........................................................................................................................................

V. පහත සඳහන් වචන වල අර්ථය ලියන්න

පරඬැල් - .................................................. කැප - ..................................................

නිවහල් - .................................................. කැදැල්ල - ..................................................

(ලකුණු 4 X 5= 20 )

10. පහත සඳහන් ඡේදය කියවා එහි ඇති වචන ප්‍රමාණය තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කර ලියා දක්වන්න.

සත්ත්ව විද්‍යාඥයින් විසින් දිර්ඝ කාලයක් තිස්සේ කරන ලද විවිධ පර්යේෂණවල ප්‍රතිඵලයක් වශයෙන් මනුෂ්‍යයා හා වානරයා අතර සමීප සම්බන්ධතාවක් ඇති බව හෙළි වි තිබේ.වානර වර්ගයා ගැන කරන ලද සුක්ෂ්ම සොයා බැලීම් පාදක කොට ගෙන චිම්පන්සීන් යනු මහා වානරයන්ගේ විශේෂිත උපසත්ත්ව කොට්ඨාසයක් ය යන නිගමනයට පැමිණ ඇත. සෙසු වානරයන්ගේ මෙන් ම චිම්පන්සීන්ගේ ද විශේෂිත ජන්ම භූමිය අප්‍රිකාවේ මහා වනාන්තර ප්‍රදේශය යැයි කියනු ලැබේ. නූතන සංවර්ධනයට ඉඩ දෙනු වස් මේ ඝන වනාන්තරය ක්‍රමයෙන් එළි පෙහෙළි වීමට භාජනය වීම නිසා චින්පන්සීන් ඇතුළු වානර කුලයේ සත්ත්වයන්ට පමණක් නොව සෙසු සතුන්ට ද යන එන මං නැති වී යන තැනට හෙවත් තම පාරම්පරික ජන්ම භූමියේ උරුමය අහෝසි වී යන තැනට විවිධ සාධක මතු වී ගෙන එයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
......................................................................

(ලකුණු 20 )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**සිංහල භාෂාව හා සාහිත්‍යය තරගාවලිය 2023**

**කලාප මට්ටම**

**භාෂා භාවිතය හා අවබෝධය**

**11 ශ්‍රේණිය** **කාලය පැය 03 යි.**

- ❖ අපේක්ෂකයාගේ නම :- ..........................................................................................
- ❖ විදුහලේ නම සහ ලිපිනය:-.....................................................................................
- ❖ කලාපය:- ...........................................................................................................
- ❖ පාසල් වර්ගය:-200 තෙක්/ 201 සිට 500/ 500 ට වැඩි.

**I , II හා III යන කොටස්වල ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

**I කොටස**

01. පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I ඌෂ්ම ව්‍යාංජනාක්ෂර ලියා දක්වන්න
.........................................................................................

II විසර්ගය යෙදෙන වචන දෙකක් ලියන්න.
...................................................................................

III වර්ගාන්ත අනුනාසික අක්ෂර පිළිවෙළින් ලියන්න.
.......................................................................

IV ඔ, ඕ, ඖ යන අක්ෂර උත්පත්ති ස්ථානය අනුව නම් කරන්න.
.......................................................................................................................

V පහත සඳහන් ව්‍යාංජන සංකේත යෙදුණු වචනය බැගින් ලියන්න.
රකාරාංශය - ....................................... රේඵය - ..........................................

(ලකුණු 1 X 5= 5 )

02. (අ) පහත සඳහන් පේළිවල දැක්වෙන වචන අතුරින් නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා ලියන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| I | සමස්ථ ලංකා | විශ්මය | කනගාටුව | ෙඖෂධ | ....................................... |
| II | ජනගහණය | අර්බූදය | කාර්යයාලය | ක්‍රීඩාංගනය | ....................................... |
| III | ලේඛණ | පරිසනකය | ප්‍රස්තාව පිරුළු | මාණවිකාව | ...................................... |

(ලකුණු 1 X 3= 3 )

(ආ)පහත දැක්වෙන සංදේශ නමාවලිය අකාරාදි පිළිවෙළට සකස් කර ලියන්න.

නීලකොබෝ , සැළලිහිණි , ගිරා , තිසර , කැටකිරිලි , පරෙවි , හංස , කෝකිල , මයුර , කහ කුරුලු

.......................................................................................................................

.......................................................................................................................

(ලකුණු 1 X 2= 2 )

03. පහත සඳහන් පද අයත් ව්‍යාකරණ වර්ගය ලියන්න

| | | | |
|---|---|---|---|
| (i) අනුපාත | - ....................................... | (vi) නා හිමි පා | - ....................................... |
| (ii) අග්ගලා | - ....................................... | (vii) පුපුරවයි | - ....................................... |
| (iii) බිබිලි | - ....................................... | (viii) වනිතාවෝ | - ....................................... |
| (iv) නැළවිලි | - ....................................... | (ix ) ඉක්බිති | - ....................................... |
| (v ) පරිපථ | - ....................................... | (x ) නැගෙනහිර | - ....................................... |

(ලකුණු 1/2 X 10= 5 )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

04. (අ) පහත සඳහන් ක්‍රියාපද වල ප්‍රකෘතිය (ධාතුව) වෙන් කොට දක්වන්න.

(iii) ලියයි - ......................................... (ii) දුවයි - .........................................

(ආ) පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත කොටස් සඳහා ගැළපෙන සමාස පද යොදා නැවත ලියන්න

i. **ගොවින්ට ලබා දෙන පොහොර** නොලැබීමෙන් අස්වැන්න නිසරු වී ඇත.

......................................................................................................................................

......................................................................................................................................

ii. **මුතු වැනි දත්** ඇති ඇයගේ සිනහව සැම සිත් වශී කරවයි.

......................................................................................................................................

......................................................................................................................................

iii. **ඉර ද හඳ ද තරු ද** ඇති ලොවක ඔහු අතරමංව බලා සිටියි.

......................................................................................................................................

......................................................................................................................................

(ලකුණු 1 X 5= 5 )

05. පහත දැක්වෙන වාක්‍යවල කද කළු අකුරින් මුද්‍රිත පද කුමන විභක්තියට අයත් දැ' යි ලියන්න.

I ඉඳුරා බලන් **සබඳිනි** සිට පොතු පිටිය

......................................................................................................................................

II තව සුර බඹෙක් **ඇගේ** කිරිදත් කැකුළු බැලී

......................................................................................................................................

III **ගහින්** ගහට පැන පැන අඹ වදුලුවල

......................................................................................................................................

IV **කුමරු** බැබළිණි මහත් පින්යුත

. ......................................................................................................................................

V **සලෙළුන්** යනෙන නිති කර කෙළි කවටාන

. ......................................................................................................................................

(ලකුණු 1 X 5= 5 )

06. පහත සඳහන් වාක්‍ය වල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ග නම් කරන්න.

I " සියලු සිසුන් ක්‍රීඩා තරග සඳහා **සූදානමින්** " දහවල් දහය වන විට ක්‍රීඩාංගණයට **පැමිණිය යුතුය**.

........................................................ ........................................................

II නවක ගායිකාවන් වේදිකාවට **පැමිණ** ගීත ගායනා **කරද්දී** සියල්ලෝ ම ඔල්වරසන් දුන්හ.

........................................................ ........................................................

III මිනිසා වටපිට **බලමින්** කොලුවා ලවා දර **කප්පවයි**.

........................................................ ........................................................

IV විභාගයට පාඩම් **කළොත්** විශිෂ්ට ජයග්‍රහණයක් හිමිවන බව ලකුණු වාර්තා පරික්ෂාකර **බැලූ** පරික්ෂකවරයා පැවසීය.

........................................................ ........................................................

V පළාත් ජයග්‍රහණ ලැබූ සියලු සිසුන්ට ජාතික මට්ටමේ ජයග්‍රහණයන් ද **ලැබේවා**' යි යනුවෙන් සුබ **පැතූ** අධ්‍යක්ෂතුමිය කතාව අවසන් කළා ය.

........................................................ ........................................................

(ලකුණු 1/2 X 10= 5 )

07. (අ) පහත දැක්වෙන වාක්‍ය සදොස් නම් නිදොස් කර ලියන්න.

I ඇතැම් කෙනෙක් සාවධානව සවන් දෙයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

.......................................................................................................................................

II හෙදියෝ රෝහලට පැමිණ නැත.

.......................................................................................................................................

III බිසව් තුමූ මහ සඟනට දන් පිළියෙල කළහ.

.......................................................................................................................................

IV මා විභාගයෙන් සමත් වෙති' යි දෙමාපියන් සිතා සිටියහ.

.......................................................................................................................................

V ගායකයෝ සමග ගායිකාවෝ ද ගී ගයති.

.......................................................................................................................................

(ලකුණු 1 X 5= 5 )

(ආ) පහත දැක්වෙන වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.

I වෛද්‍යවරයා මා සුවපත් කළේය.

.......................................................................................................................................

II කම්කරුවෝ තම ශ්‍රමය ජාතියට පුදති.

.......................................................................................................................................

III පොලීසිය ඔත්තු ලබා ගැනීමට රහස් පරික්ෂකවරයෙකු යොදවයි.

.......................................................................................................................................

IV නුඹ අප පිළිගත්තෙහි.

.......................................................................................................................................

V ගුරුවරු ත්‍යාගලාභීන් තෝරති.

.......................................................................................................................................

(ලකුණු 1 X 5= 5 )

II කොටස

08. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වර්තමාන සමාජ විද්‍යාඥයෙකු විසින් ඉතාමත් උචිත ලෙස නම් කරන ලද 'අනුහස් ' (දේව අනුහස) හෙවත් වැරිස්මා නැමැති ගුණාංගයෙන් රජවරු යුක්ත වුහ. රාජකිය කටයුතු හා පූජක කටයුතු එකිනෙකින් වෙන් කරන බෙත්ම (සීමාව) බොහෝ අවස්ථාවල දී ඉතා ම සියුම් විය. විවිධ ආගමික බලපෑම් නිසා දිව්‍යමය රජුන් පිළිබඳ ඇදහිල්ල අධ්‍යාත්මික දෙයක් බවට පෙරළීම යුරෝපයේ දී සිදු වුණි. එසේ වුව ද ක්‍රි.ව. 312 න් පසුව පවා ආගමික පුද පිළිවෙත් යා කරන ලද රාජාභිෂේක මංගල්‍යය අවිච්ජින්නව පැවතුණි.කෙසේ වුවත් රජවරුන් තවදුරටත් දෙවිවරු නොවුණ ද රාජ්‍යත්වයට පත්වන නරපතියට දේවත්වය අරෝපණය කිරීමේ පිළිවෙත අඛණ්ඩව ක්‍රියාවේ යෙදිණි.ලංකාව සහ කාම්බෝජය වැනි අනෙකුත් බෞද්ධ රටවල ද රජු දෙවියන් සමග ඉතා කිට්ටුවෙන් සම්බන්ධතා ඇති කෙනෙකු ලෙස සැලකේ. සූර්යයාට ලෝකය ලෝකය හැසරවීමේ ශක්තිය ඇතැයි සලකා ගෙන රජවරුන් ද තම වංශය සූර්යාගෙන් පැවත එන බව පෙන්වීමට තැත් කළ බව පෙනේ. 'නීතිය හා සාමය දරා සිටින්නේ සූර්යාය' යන සංකල්පය 'විමලධර්ම සූර්යය' වැනි රාජකීය නම්වලින් ප්‍රකාශ වේ.

පාරම්පරික රාජ්‍ය උරුමවීමේ දැඩි සම්ප්‍රදායක් ලංකාවේ නොතිබුණ හෙයින් රාජාභිෂේක මංගල්‍යයන් ඉතා වැදගත් කාර්යයක් සිදු කරනු ලැබීය.අභිෂේක මංගල්‍යෙයහි මුඛ්‍ය පරමාර්ථය වූයේ නරයන් දෙවියන් බවට පත් කිරීමය. ලංකාවේ රාජ්‍යත්වය පිළිබඳ ඉතිහාසය ' ව්‍යාජ' ' අනුහස්' අතර සට්ටන ඇති වූ අවස්ථාවලින් ගහණ වී ඇත.රජවරුන් සාක්ෂි විරහිතව උත්තරිතර බලයකට හිමිකම් කී විට සහ ආදියේ පටන් පැවත ආ සද්චාරිත්‍රයනට පිටු පා කෲර ලෙස රට පාලනය කළ විට ඔවුහු සිහසුනෙන් නෙරපා දමනු ලැබුහ.පැරණි රජවරුන් අනුගමනය කළ යහපත් ක්‍රියාමාර්ගය පිළිපදිමින් යුක්තිය , කරුණාව , මුදිතාව , උපේක්ෂාව යනාදී ගුණාංග උසස් කොට සැලකූ චාරිත්‍රානුකූල නීති හෙවත් ව්‍යාවහාර යුක්ති ධර්මයන්ට මෙන්ම ඔහුගේ අනු

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

දැනුම උදෙසා පැවත එන ලිඛිත නීති සහ උපදේශවලට අනුකූලව සිය රාජ්‍ය විචාරණය රජතුමාගෙන් අපේක්ෂා කරනු ලැබීය.

I ‘දිව්‍යමය රජුන් ’ පිළිබඳ ඇදහිල්ල අධ්‍යාත්මික දෙයක් බවට පත් වූයේ කුමක් නිසා ද ?

...........................................................................................................................

...........................................................................................................................

II රාජාභිෂේක මංගල්‍යයේ මුඛ්‍ය පරමාර්ථය කුමක් ද?

...........................................................................................................................

...........................................................................................................................

III රජවරුන් සූර්ය වංශයෙන් පැවතෙන්නන් බව දැක්වීමට උත්සහ කළේ මක් නිසා ද ?

...........................................................................................................................

...........................................................................................................................

IV රජවරුන් සිහසුනෙන් නෙරපා දමන ලද්දේ කවර අවස්ථාවල දී ද ?

...........................................................................................................................

...........................................................................................................................

V රටවැසියා රාජ්‍යයේ රජුගෙන් අපේක්ෂා කරන්නේ මොනවා ද ?

...........................................................................................................................

...........................................................................................................................

(ලකුණු 4 X 5= 20 )

09. පහත දැක්වෙන පද්‍ය පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දුම්මල ගල ඉමේ මහ මුකලානේ
අඳෝනාව ඇහ හීගඩු ගහන්නේ
කන්දේ පරවේණි උළලේනියන්නේ
රෑ සමයමේ ඇයි මා බය කරන්නේ

අපෙ අම්මා දුම්මල ගලවන්න ගියා
ඒවා මිටි බැඳං වඳුරඹ පොළට ගියා
හාල් ටිකට පොල් ගෙඩියට ණයක් තියා
කොපි පොතකුයි පැන්සලකුයි ගෙනෙන්නියා

වැහි වැහැලා ගල ආඳා බඩේ උණා
අම්මා එදත් ඒ ගල මුදුනට ම උණා
රූටා ගිහින් පාමුල ගලටත් රිදුණා
අම්මා තිව් විලාපය තවමත් ඇසෙණා

ඇලබඩ රුප්පාව ළඟ රෑ හඳ පානේ
ඉන්නා කලට මට දුම්මල ගල පෙනුනේ
ලෝබ නැතිව ඔය ගල දුම්මල දුන්නේ
අම්මා පෙරළුවත් තරහක් නෑ හිතුනේ

I අනාගත ඛේදවාචකයක් පිළිබඳව පැවසීමට කවියා යොදාගත් සංකේතය කුමක් ද ?

...........................................................................................................................

II “වැහි වැහැලා ගල ආඳා බඩේඋණා ” පද්‍ය පාඨයේ අදහස ලියන්න ?

...........................................................................................................................

III මව තම දරුවාගේ අධ්‍යාපනයට දැක්වූ ළැදියාව හඟවන පද්‍ය පාඨ උපුටා දක්වන්න.

...........................................................................................................................

IV සහෘදයා තුළ චිත්තරූප ඇති කරන අවස්ථාවක් ලියන්න.

...........................................................................................................................

V පහත සඳහන් වචන වල අර්ථය ලියන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

i රුප්පාව - ............................................ ii පරවේණි - ........................................
iii ඉම - ............................................ iv රුටාගෙන - ........................................

(ලකුණු 4 X 5= 20 )

10. පහත දැක්වෙන ඡේදය එහි වචන ප්‍රමාණයෙන් තුනෙන් එකක් වන සේ සාරාංශ කර ලියන්න.

ඉන්දීයාවේ අශෝක යුගය බුද්ධාගම ඉතා ම දිප්තිමත් කාල පරිච්ඡේදය විය. අශෝක යුගයෙන් පසු බුද්ධ ධර්මය ගැන නොයෙකුත් වාද විවාද ඇති වන්නට විය. බෞද්ධ ආරාමයන්හි හා වෙනත්, සංඝයා එක් රැස් වූ සංඝ සභාවන්හි ඇති වූ මෙම වාද විවාද තුළට දකුණු දෙසින් හා විශේෂයෙන් ම බටහිරින් නවක අදහස් ගලා එන්නට විය.ඉන්දියාවේ ආර්ය සභ්‍යත්වය ඇති වන්නට පෙර සිට ම වාගේ මහජනයා අතර පැවති මිථ්‍යා දෘෂ්ටික ඇදහීම ආර්යන්ගේ හින්දු ආගමට පවා ඇතුළත් වී තිබුණ ද බෞද්ධ දේශනාවලින් ඒවාට පහර එල්ල විය.මෙම ඇදහීම්වල බලපෑම සමඟ ග්‍රීක හා රෝම බලපෑමෙන් නැඟුන ඇදහිම් ද බුද්ධාගමට ඇතුළත් කර ගැනීමට බ්‍රාහ්මණයන් ඇතුළු එක් පාර්ශවයක් යත්න දැරූහ. දේව ඇදහීම් හා ඒවාට අදාළ විසිතුරුමත් යාග පැවැත්වීමට බුදුරජුන්ගේ දේශනාවලින් පහර වැදී ම හින්දු බ්‍රාහ්මණයන්ගේ උසස් තත්වයට ද වැදුණු පහරකි. බුද්ධාගමේ පිරිසිදු පිළිවෙත් සමුදායට හානිකර වූ මෙවැනි ඇදහීම් ඇතුළු බටහිරින් පැමිණි නවක අදහස් ද බුද්ධාගමට ඇතුළත් කර ගැනීමට වෙහෙස දැරුවන් අතර බ්‍රහ්මණයන් ප්‍රමුඛ වූයේ එ හෙයිනි.

එක් අතකින් ඔව්හු බුද්ධාගමේ පරිහානිය බලාපොරොත්තුවෙන් සිටි පිරිසකි. දේව ඇදහිම් හා යාගකරණය බුද්ධාගමට ඇතුළත් කර ගැනීමෙන් ඉන්දියාවේ එදා බෞද්ධ සමාජයේ ඔවුනට අහිමිව තිබුණ පූජක තත්වය නැවත ලබා ගැනීමට හැකි බව බ්‍රහ්මණයෝ විශ්වාස කළහ.

................................................................................................................................................
................................................................................................................................................
................................................................................................................................................
................................................................................................................................................
................................................................................................................................................
................................................................................................................................................
................................................................................................................................................
................................................................................................................................................
................................................................................................................................................
................................................................................................................................................
................................................................................................................................................
................................................................................................................................................
................................................................................................................................................
................................................................................................................................................
................................................................................................................................................
................................................................................................................................................
................................................................................................

(ලකුණු 20 යි )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**සිංහල භාෂාව හා සාහිත්‍යය තරගාවලිය 2023**

**කලාප මට්ටම**

**භාෂා භාවිතය හා අවබෝධය**

**12/13 ශ්‍රේණිය** **කාලය පැය 03 යි.**

- ❖ අපේක්ෂකයාගේ නම :- ..........................................................................................
- ❖ විද්‍යාලයේ නම සහ ලිපිනය:-..........................................................................................
- ❖ කලාපය:- ..........................................................................................
- ❖ පාසල් වර්ගය:-200 තෙක්/ 201 සිට 500/ 500 ට වැඩි.

**I , II හා III යන කොටස්වල ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

**I කොටස**

1. පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

I සිටාණ , ඇත්තු , ඉන්නකින් යන පද වල ප්‍රකෘති රූප වෙන් කොට දක්වන්න.

........................................... ................................... ..................................

II පහත දැක්වෙන වචන අකාරාදි පිළිවෙළට සකස් කරන්න.

සර , ස්වර , ශබ්දය , විල , ඍතුව , රශ්මිය

..........................................................................................

III අක්ෂර වින්‍යාසය නිවැරදි වචනය තෝරා ලියන්න

අත්‍යාවශ්‍ය , විස්මයාවහ , මුකුළිත , ප්‍රනීත

..........................................................................................

IV “ කුරුණිය” යන පදයෙහි ඇතුළත් පිල්ලම් ලියා දක්වන්න.

..........................................................................................

V ෆ , ඎ යන අකුරු සහිත වචන දෙකක් ලියන්න.

..........................................................................................

(ලකුණු 1 X 5= 5 )

2. (i) පහත සඳහන් පද විසන්ධි කර සන්ධි නාමය ද ලියන්න

| | | විසන්ධිය | සන්ධි නාමය |
|---|---|---|---|
| I | අප්පුඩි | ........................................... | ........................................ |
| II | අනුරුත් | ........................................... | ........................................ |
| III | ජන්මාධිපති | ........................................... | ........................................ |
| IV | නන්නාඳුනන | ........................................... | ........................................ |
| V | රාජාවලිය | ........................................... | ........................................ |

(ලකුණු 1/2 X 5= 21/2 )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(ii ) පහත දැක්වෙන විසන්ධි පද සන්ධි කර සන්ධි නාමය ද ලියන්න.

| | විසන්ධි පදය | සන්ධි පදය | සන්ධි නාමය |
|---|---|---|---|
| I | රද් + ගම | ..................................... | .................................. |
| II | බහු + අර්ථ | ..................................... | .................................. |
| III | එක් + එළි | .................................... | ................................... |
| IV | උමඟ +දා | ..................................... | .................................... |
| V | බත් + උළු | ..................................... | .................................... |

(ලකුණු 1/2 X 5= 21/2 )

03. (i) පහත දී ඇති පද වල තද්ධිත ප්‍රත්‍යා වෙන් කොට දක්වන්න.

(අ) කොපුලත් - ..............................................
(ආ) නාරටි - ...............................................
(ඉ) ජනතා - ..............................................
(ඊ ) කණිෂ්ට - ............................................... (ලකුණු 1/2 X 4= 2)

(ii)පහත දී ඇති හත්සම වචනවලින් බිදෙන තත් හව රූප ලියන්න.

(අ) ආචාර්ය - ..............................................
(ආ) වර්ධන - ...............................................
(ඉ) දර්ශන - ..............................................
(ඊ ) ස්කන්ධ - ............................................... (ලකුණු 1/2 X 4= 2 )

(iii )පහත දී ඇති තත්භව වචනවලින් බිදි ආ තත්සම රූප ලියන්න.

(අ) ගොයුම් - ..............................................
(ආ) නිදසුන් - ...............................................
(ඉ) පිළිඹිබු - ..............................................
(ඊ ) අපිස් - ............................................... (ලකුණු 1/2 X 4= 2 )

(iv)පහත සඳහන් පදවල සමාස වර්ගය නම් කරන්න.

(අ) පාතඹර - ..............................................
(ආ) මන්දහාසිනි - ...............................................
(ඉ) ප්‍රබුද්ධ - ..............................................
(ඊ ) වනමල් - ............................................... (ලකුණු 1/2 X 4= 2 )

(v) මුලින් දැක්වෙන ව්‍යාකරණ වර්ගයට අයත් නොවන පදය තෝරන්න.

(අ) කෘදන්ත - පතළ , ලියුම් , සිහන , පිරුවන්
(ආ) නිපාත - බොහෝ , සළ , එමබල , ඉක්බිති
(ඉ) උපසර්ග - ඉසුරු , සංවර , ප්‍රතිචාර , සුද්ධ
(ඊ ) මිශ්‍ර ක්‍රියා - නටනටා , නටමින් , නටත් ,සලමින්

(ලකුණු 1/2 X 4= 2 )

04. පහත දැක්වෙන පද අයත් ව්‍යාකරණ වර්ගය වරහන් තුළින් තෝරා තිත් ඉරි මත ලියන්න.
(අනුක්ත පද , තද්ධිත, විභක්ති සමාසය ,ආගම සන්ධිය , අනියමාර්ථ උක්ත පද , අතීත කර්තෘ කාරක කෘදන්ත, භාවාර්ථයෙහි නිපාත , අසම්භාව්‍ය ක්‍රියා , අපර ක්‍රියා , කර්මකාරක ක්‍රියා)

I තුනුවග , මියුගුණ - ....................................................................................
II ගුරු පඬුරු , බුදු ගුණ - ....................................................................................
III රුමත් , මොළකැටි - ....................................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

IV මැණිකක් , නළුවෙක් - ..........................................................................
V පිහිටි , කුඩු - ..........................................................................
VI අනේ , අයියෝ - ..........................................................................
VII බැලෙයි , ඇල්ලෙයි - ..........................................................................
VIII බලත , කියත - ..........................................................................
IX ගසක් , වඳුරෙක් - ..........................................................................
X බලනුව , රකිනුව - ..........................................................................

05. (අ) පහත සඳහන් වාක්‍යයන්හි සදොස් තැන් ඇතොත් නිදොස් කර ලියන්න.

I ඕ තොමෝ මහ සඟනට වෙසක් පොහෝ දා සිවුරු පිරිකර පූජා කළහ.

..........................................................................................................

II සිසුහු පන්ති කාමරයෙන් බැහැරව සිටි බව ගුරුතුමා පැවසීය

..........................................................................................................

III දේශනය ශ්‍රවණය කරන සමහර අයෙක් නිදා වැටෙයි.

..........................................................................................................

IV සංගීත ප්‍රසංගයට පැමිණි තරුණයින් හතර දෙනෙක් රංගනය ඉදිරිපත් කළහ.

..........................................................................................................

V මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා ඉතිහාසඥයෙක් මෙන් ම පුරාවිද්‍යාඥයෙක් ද වෙයි.

..........................................................................................................

(ලකුණු 1/2 X 5= 21/2 )

(ආ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය වීමට සුදුසු පද තෝරා වාක්‍ය නැවත ලියන්න.

I (අප /අපි) හෝ (ඔවුහු /ඔවුන් ) ගමට යති.

..........................................................................................................

II (සමාජිකයින් / සමාජිකයෝ ) පැමිණියහොත් ( අපි/අප) රැස්වීම පවත්වමු.

..........................................................................................................

III (ගොවින් /ගොවීහු) නොහොත් ( ධීවරයන් / ධීවරයෝ) යෝජනාවට විරුද්ධ වෙති.

..........................................................................................................

IV විශේෂඥ (වෛද්‍යවරුන් / වෛද්‍යවරු ) විසින් සිසුන් ලවා ( රෝගීහු / රෝගීන්) පරීක්ෂාවට ලක්කරවනු ලැබුහ.

..........................................................................................................

V සද්ධර්මරත්නාවලිය ( ලියුවේ /ලියුවෝ ) ධර්මසේන ( හිමියෝය / හිමිපාණන් ය)

..........................................................................................................

(ලකුණු 1/2 X 5= 21/2 )

06. (අ) පහත දැක්වෙන වාක්‍ය කර්මකාරකයකට හරවන්න.

I සාහිත්‍යකෘතීහු චමත්කාරයෙන් රසිකයන් පිනවයි.

..........................................................................................................

II අධ්‍යක්ෂවරයා මිහිඳු විද්‍යාලය නවක ගුරුවරියක පත් කළේය

..........................................................................................................

III කණකැස්බෑවා විය සිදුරෙන් අහස බලයි.

..........................................................................................................

IV ප්‍රවීණ නාට්‍ය විචාරකයෙක් මනමේ නාට්‍ය පිළිබඳ ප්‍රේෂකයන් දැනුවත් කරයි.

..........................................................................................................

V තොටගමුවේ රාහුල හිමියෝ සංදේශ කාව්‍ය රචනා කළහ.

..........................................................................................................

(ලකුණු 1/2 X 5= 21/2 )

(ආ) පහත දැක්වෙන කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයට හරවන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

I ආධුනික ශිල්පියෙකු විසින් විශිෂ්ට නිර්මාණයක් කරන ලදි.

.......................................................................................................................................

II මා විසින් උත්සවයට පැමිණි අමුත්තෝ පිළිගැනෙති.

.......................................................................................................................................

III ශිෂ්‍යයන් විසින් විවාද තරගයක් සංවිධානය කෙරේ.

.......................................................................................................................................

IV මුහුදු ළිහිණියන් විසින් දියඹෙහි පිහිණන මත්ස්‍යයෝ ඩැහැ ගැනෙති.

.......................................................................................................................................

V ඔවුන් විසින් දෙමව්පියෝ පුදනු ලබත්.

.......................................................................................................................................

(ලකුණු 1/2 X 5= 21/2 )

07. (අ) මුලින් දැක්වෙන පදයේ අර්ථය නොදෙන පදය තෝරන්න

I සොම්නස - අමොද , තුටු , විදුවත් , තිසුම්

II නිරතුරු - නිබද , සතත , නිතර , නියවන්

(ලකුණු 1/2 X 2= 1 )

(ආ )මුලින් දැක්වෙන පදයේ බහුඅර්ථය නොදෙන පදය තොරන්න.

I තුරු - ඉවුර , තූර්ය , වෘක්ෂය , සතුට

II සිය - ලෝකය , වතුර , ජය , සමය

(ලකුණු 1/2 X 2= 1 )

(ඉ) පහත දී ඇති යෙදුම් සඳහා තනිපද ලියන්න.

I සහමුලින් ම විනාශ කිරීම

.........................................................................................

II යම් ශබ්දයකින් හට ගන්නා දෝංකාරය

.........................................................................................

(ලකුණු 1/2 X 2= 1 )

(ඊ) පහත දැක්වෙන ඉඟි වැකි වල අදහස ලියන්න.

I අං මැදීම - .........................................................................................

II කළුකඩකාරයා - .........................................................................................

(ලකුණු 1/2 X 2= 1 )

(උ) දෙන ලද ප්‍රකාශයට ගැළපෙන ප්‍රස්තාව පිරුළු ලියන්න

I කළ අනුවණකමට පිළියම් කළ නොහැක

II අයුක්තිය බල පැවැත්වීම

(ලකුණු 1/2 X 2= 1 )

II කොටස

08. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මිනිසා විසින් සොයාගන්නා ලද්දා වූ ද , නිර්මාණය කරන ලද්දා වූ ද සියල්ල අතුරින් භාෂාව මුල් තැන ගනී. අප චින්තනයේ යෙදෙන්නේ ද , චින්තනයෙන් මතු කර ගන්නා වූ නන් අයුරේ අදහස් ප්‍රකාශ කරන්නේ ද බෙහෙවින් භාෂාව ඇසුරෙනි. ඒ අදහස් පරම්පරාවෙන් පරම්පරාවට ගලා එන්නේ ද භාෂාව මාධ්‍ය සේ ගෙන ය. ඒ අනුව ද භාෂාව

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සංස්කෘතියේ ප්‍රවාහකයා වේ .මනුෂ්‍ය ජීවිතයෙහි මේ සා උසස් තැනක් ගන්නා අංශයක් වන භාෂාව සියලු විෂය අධ්‍යාපනයෙහි මාධ්‍ය බව වෙසෙසින් නො කිව මනාය. භාෂාව ද විෂය ගණයට වැටේ.ඒ නිසා අප භාෂාවෙන් ඉගෙන ගන්නා සේ ම භාෂාව ද උගත යුතු ය. සිංහලය උසස් සංස්කෘතියක වාහකයා බවට පත් වූයේ මෙයට දෙදහස් වසරකට ද පෙර ය.විෂයය කවරක් වේවා ඒ පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමේ මාධ්‍යයක් වශයෙන් කවර දා වුව සිංහලය දුබලතාවක් නො දැක්වී ය. දැනුදු නො දක්වයි.ස්වභාෂා අධ්‍යාපන මාධ්‍යය වීම, ජනමාධ්‍ය ව්‍යාප්තිය ,ජනගහන වර්ධනය ආදීය සාධක සේ ගෙන සිංහල භාවිතය පුළුල් වූවේ ම ය. එතෙක් අවාසනාවකට හෝ ප්‍රමාණවත් ගුණාත්මක වර්ධනයක් එහි පෙනෙන්නට නැත.

I මිනිසා නිර්මාණය කළ දෑ අතර මුල්තැන ලැබෙන්නේ කුමකට ද ?

..............................................................................................................................................

.............................................................................................................................

II භාෂාව සංස්කෘතියේ ප්‍රවාහකයා ලෙස සලකන්නේ කුමක් නිසා ද?

..............................................................................................................................................

.............................................................................................................................

III සිංහල භාෂා භාවිතය පුළුල් වීමට බල පෑ හේතු දෙකක් ලියන්න.

..............................................................................................................................................

.............................................................................................................................

IV සිංහල සංස්කෘතියේ වාහකයා බවට සිංහල භාෂාව පත් වූයේ වසර කීයකට පසුව ද?

.....................................................................................................................................

.....................................................................................................................................

V අප භාෂාව උගත යුත්තේ ඇයි ?

..............................................................................................................................................

..............................................................................................................................................

........................................................................................................................

(ලකුණු 4 X 5= 20 )

09. පහත සඳහන් කවි පංතිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සිත් සන් තොසින් වන් නෙ දෙසින් දනන්ගෙන්
පිරි සැදෙන්නා අනුරාපුරේ මං
ගත් මල් පහන් අත් ඇතියන් පහන් වී නිතින් සරන්නා
මහ මේ වෙනේ දූල්
අයෙක් සැදීයෙත් වට වන්දනාවේ
හිඳිත් අයෙක් රුක් සෙවණේ නිවා ගිම්
අබා වැවින් නා කිසිවෙක් නැගීයෙත්
බලා කෙනෙක් නෙක් නටඹුන් පිරික්සා

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

විදිත් තිසා වැ ඉවුරේ පවන් ඇල්
කෙනෙක් විදීත් නිවමින් ගතේ ගිම්
පොසොන් මසේ දූල් පලු වීර රුක් නෙත්
තුසිත් අයෙක් ඉන් පල ඇ බිදිමෙන්

I අනුරාධපුරය ජනාකීර්ණ වූයේ කෙසේ ද ?

........................................................................................................................................

........................................................................................................................................

II මහමේව්නා උයනේ හැසිරෙන්නේ කවරහු ද ?

........................................................................................................................................

........................................................................................................................................

III "මේ වියළි කාළගුණයක් පවත්නා කාලයක් ය " යන නිගමනයට පැමිණීමට තුඩු දෙන කරුණු 02 ක් ලියන්න

........................................................................................................................................

........................................................................................................................................

IV පද්‍යයෙහි ඇතුළත් බහු අර්ථ පද දෙකක් තෝරා ලියන්න.

........................................................................................................................................

........................................................................................................................................

V පහත පදවලට සම අරුත් දක්වන්න

i. වන් - ...............................................
ii. දූල් - ...............................................
iii. ගිම් - ...............................................
iv. තුසිත් - ...............................................

(ලකුණු 4 X 5= 20 )

## III කොටස

11. පහත දී ඇති ඡේදය තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියන්න.

" අලංකාර " යන ශබ්දයෙහි අර්ථය ද කලින් කල වෙනස් වූ බව පැරණි පොත පත හදාරෙන්නෙකුට පෙනී යයි. භාමාහාදින් මෙම පදය භාවිත කළේ උපමා රූපකාදී අර්ථාලංකාරයන් හා යමක අනුප්‍රාසාදි ශබ්දාලංකාරයෙනුත් පොදුවේ හඳුන්වන ජාති නාමයක් වශයෙනි . එසේ ද වුවත් , දණ්ඩින්ගේ භාවිතය අනුව මේ පදය මෙයට වඩා බෙහෙවින් පළල් අර්ථයක් දෙයි. කාව්‍යයේ ශෝභාව ඇති කරවන ධර්මයෝ යම්තාක් වෙත් ද ඒ සියල්ල ම අලංකාර හැටියට දණ්ඩින් කල්පනා කළේ ය.මෙසේ දණ්ඩින්ගේ ව්‍යවහාරය අනුව උපමා යමකාදී ලක්ෂණ පමණක් නොව ගුණ මාර්ගාදී කාව්‍යාංග ද අලංකාර වශයෙන් හැඳින්විය හැක. කාව්‍ය පාඨකයාගේ රුචිය දිනා ගැනීමට හේතුභූත වන ඕනෑ ම ලක්ෂණයක් මේ අයුරින් අලංකාර යයි කිව හැකි ය.' අලංකාර ' යන පදයට වඩාත් පුළුල් අර්ථයක් ගෙන දුන්නෙක් ලෙස වාමන නම් රීතිවාදියා හැඳින්විය හැකි ය.'කාව්‍ය වූ කලී අලංකාර මගින් වටහා ගත යුත්තක්ය' යනුවෙන් කී වාමන , අලංකාර යනුවෙන් අදහස්

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

කළේ කාව්‍ය පුරා පැතිර පවතින සෞන්දර්ය නැතහොත් චමත්කාරය යි. මේ අලංකාරයට ( සෞන්දර්යයට ) හේතුභූත වන්නේ කාව්‍ය ගුණ විය හැකි ය.නැතහොත් එහි රීතිය විය හැකි ය. නොඑසේ නම් උපමා දී උක්ති ක්‍රමයක් හෝ යමකාදී ශබ්ද ලක්ෂණයක් විය හැකි ය.එසේත් නැත්නම් ඕනෑම කාව්‍යාංගයක් විය හැකි ය.යම් යම් අවස්ථාවලදි මෙතරම් පෘථුල අර්ථයකින් වහරනු ලැබූ ‘ අලංකාර ’ පදය කල් යෑමේ දී නැවතත් පටු අර්ථයක් දීම සඳහා භාවිත කෙරිණි.පශ්චාත්කාලීන විචාර ග්‍රන්ථවල යළිත් මෙම පදය භාවිත කර ඇත්තේ , අර්ථාලංකාර හා ශබ්දාලංකාර පොදුවේ හඳුන්වන ජාති නාමයන් වශයෙනි. එනම් භාමහ එම පදය භාවිත කළ අර්ථයෙනි.

...................................................................................................................................................................

...................................................................................................................................................................

...................................................................................................................................................................

...................................................................................................................................................................

...................................................................................................................................................................

...................................................................................................................................................................

...................................................................................................................................................................

...................................................................................................................................................................

...................................................................................................................................................................

...................................................................................................................................................................

...................................................................................................................................................................

...................................................................................................................................................................

...................................................................................................................................................................

...................................................................................................................................................................

...................................................................................................................................................................

...................................................................................................................................................................

...........................................................................

(ලකුණු 4 X 5= 20 )